# රුහුණ විශ්ව විද්‍යාලය
# කළමනාකරණ හා මූල්‍ය පීඨය

පිටු : 02
ප්‍රශ්ණ : 06
මුලු ලකුණු: 60

**ව්‍යාපාර පරිපාලනවේදී උපාධි 2000 ස්ථලය – II සමාසිකය**
**අවසාන සමාසික (පුනර්) පරීක්ෂණය - ජුනි/ජුලි 2015**

**BBA 2220 - අවදානම් කළමනාකරණය** | කාලය: පැය 02

උපදෙස් : ප්‍රශ්ණ පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(1) අ). අවදානම් කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

ආ). "අවදානම" යන්න අවිනිශ්චිතතාවයෙන් වෙනස් වන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ඇ). "ශුද්ධ අවදානම" සහ "සමපේක්ෂණ අවදානම" අතර වෙනස උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06) (මුළු ලකුණු 12)

(2). අ). ව්‍යාපාර සංවිධාන සඳහා අවදානම් කළමනාකරණය වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 06)

ආ). අවදානම් තක්සේරු කිරීම යනු කුමක්ද?

(ලකුණු 03)

ඇ). ව්‍යාපාර සංවිධාන වල වගකීම් අවදානම් පැති සඳහන් කරන්න.

(ලකුණු 03) (මුළු ලකුණු 12 )

(3). අ). "අවදානම් පාලනය" සහ "අවදානම් මූල්‍යනය" අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ආ). මෑත කාලීනව සිදුවූ හානිදායක සිදුවීම් 03ක් සලක බලා විභව අවදානම් පාලන ක්‍රියාකාරකම් යෝජනා කරන්න.

(ලකුණු 06)

ඇ). අවදානම් කළමනාකරුවකුගේ රාජකාරීන් පැහැදිලි කරන්න .

(ලකුණු 03) (මුළු ලකුණු 12)

(4). ඔබ පහත ප්‍රකාශ සමග එකඟ වන්නේද? හේතු දක්වන්න.

අ). "අවදානම් කළමනාකරණය අවශ්‍ය වන්නේ විශාල ව්‍යාපාර වලට පමණි".

ආ). "අතීතයේ සිදුවූ දෙයක් නැවත ඇති විය හැකිය".

ඉ). "අවදානම් කළමනාකරණය නිවාස තුලද භාවිතා වේ'.

ඊ). "සියලු අවදානම් අන් අයට පැවරීම හොඳ අවදානම් කළමනාකරණයකි".

( කොටසකට ලකුණු 03 බැගින් ලකුණු 12)

(5). අ). "අවදානම් කළමනාකරණය නිම නොවන ක්‍රියාවලියකි". පහදන්න.

ආ). "අවදානම් කලමනාකරණයේ අරමුණ ගොඩනැගීම නොව රැක ගැනීමයි". තහවුරු කරන්න.

ඉ). "සමූහ ගතවීම අවදානමට මුහුණ දීමේ මඟකි". පහදන්න.

(එක කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 12)

(6). පහත ශිල්පීය ක්‍රම කෙටියෙන් පැහැදිලි කර උදාහරණය බැගින් දක්වන්න.

අ). අවදානම පහත හෙළීම.

ආ). අවදානම පැවරීම.

ඉ). අවදානම ප්‍රතික්ෂේප කිරීම.

ඊ). අවදානම භාර ගැනීම.

(එක කොටසකට ලකුණු 03 බැගින් ලකුණු 12)